# දෙමළ අපේක්ෂා - II

පසුගිය මැයි මස විසිපස්වැනිදා පළ වූ තීරුවෙන් අප සඳහන් කෙළේ දෙමළ ජනයාට, ඇත්තට ම දෙමළ නායකයන්ට තිබූ අපේක්ෂා දෙකක් පිළිබඳ ව ය. පළමුවැන්න වූයේ මුළු ලංකාවේ ම නායකයන් බවට පත්වීමට පොන්නම්බලම් කුමාරස්වාමි පවුලේ තිබූ අපේක්ෂාව ය. බ්‍රිතානිහු මේ අපේක්ෂාවට පොහොර දැමූහ. පොන්නම්බලම් රාමනාදන් මහතා දෙමළ ජනතාව නියෝජනය කිරීමට ව්‍යවස්ථාදායක මණ්ඩලයට පත්කෙරුණු බව සැබෑ ය. එහෙත් ඒ මහතා දෙමළ ජනතාවගේ නායකයා ලෙස පමණක් නොව මුළු මහත් ලාංකිකයන්ගේ ම නායකයා ලෙස සලකනු ලැබිණි.

සීමිත ඡන්දයක් ලැබී ඉංගිරිසි උගතුන් හා දේපොළ හිමියන් උගත් ලාංකිකයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායක මණ්ඩලයට මන්ත්‍රීවරයකු තෝරාගනු ලැබූ අවස්ථාවේ දී පොන්නම්බලම් රාමනාදන් මහතා මාර්කස් ප්‍රනාන්දු මහතා පරදවා ජයගත්තේ ය. ඒ ඡන්දයෙහි දී කුල භේදය බලපෑ බව කියැවෙයි. කරාව කුලයට අයත් මාර්කස් ප්‍රනාන්දු මහතා පැරදවීමට ගොයිගම කුලයට අයත් යැයි කියන ජේ ආර් ජයවර්ධන මහතාගේ පියා වෙල්ලාල කුලයේ රාමනාදන් මහතාට ආධාර කෙළේ යැයි කියනු ලැබේ.

ඒ කුමක් වුවත් ඒ වකවානුවෙහි දී පොන්නම්බලම් මහතාගේ පවුල මෙරට සමාජයෙහි ඉහළ තැනක් හෙබවී ය. පොන්නම්බලම් රාමනාදන් මහතාගේ සොහොයුරු පොන්නම්බලම් අරුණාශලම් මහතා ජාතික සංගමයේ සභාපතිවරයා ලෙස පත්කරගනු ලැබිණි. එකල පිහිටුවාගෙන තිබූ ඉංගිරිසි බෞද්ධ පාසල්වල ත්‍යාග ප්‍රදානොත්සවවලටද මේ මහත්වරුන්ට ආරාධනා කරනු ලැබිණි. උගත් සිංහලයන් අතර විශේෂයෙන් ම ඉංගිරිසි උගත් සිංහලයන් අතර පොන්නම්බලම් සහෝදරවරු දේශපාලන නායකත්වයට පත් වී සිටි බව පැහැදිලි ය.

1915 සිංහල මුස්ලිම් ගැටුමෙහි දී ඉංගිරිසින් විසින් සිංහල නායකයන් මර්දනය කරනු ලැබූ අවස්ථාවෙහි දී එංගලන්තයට ගොස් සිංහල නායකයන් වෙනුවෙන් පෙනී සිටියේ පොන්නම්බලම් රාමනාදන් මහතා ය. ඒ මහතා ආපසු ලංකාවට පැමිණි අවස්ථාවෙහි දී සිංහල නායකයෝ ඒ මහතා රික්ෂෝවක හිඳුවා තුමූ ම ඒ ඇදගෙන ගියහ. මෙයින් පැහැදිලි වන්නේ රාමනාදන් මහතා යුක්තිය ඉටුකරමින් සිංහල නායකයන් ද වෙනුවෙන් පෙනී සිටි බව නො වෙයි. ඒ මහතා එකල මුළු ලංකාවෙහි ම උගත් ජනයාගේ හා දේපළ හිමියන්ගේ නායකයා විය.

මේ තත්වය නැතිවන්නට පටන්ගත්තේ දෙමළ නායකයන් බස්නාහිර පළාතේ දෙමළ ජනයා සඳහා ව්‍යවස්ථාදායක මණ්ඩලයෙහි වෙන ම ආසනයක් ඉල්ලා සිටි අවස්ථාවෙහි ය. බොහෝ සිංහල නායකයන්ගේ ඇස් ඇරුණේ ඒ අවස්ථාවෙහි දී ය. ඉන්පසු දිගින් දිගටම ව්‍යවස්ථාදායක මණ්ඩලයේත් 1931 න් පසුව රාජ්‍ය මන්ත්‍රණ සභාවෙහිත් දෙමළ නායකයන්ට අවශ්‍ය වූයේ දෙමළ ආසන සංඛ්‍යාව සිංහල ආසන සංඛ්‍යාවට වඩා වැඩිකර ගැනීම ය. ඩොනමෝර් කොමිසම ඉදිරියට ගිය දෙමළ නායකයෝ සර්වජන ඡන්දය ලබාදීමට විරුද්ධ වූහ.

ඔවුන් එසේ කෙළේ සර්වජන ඡන්දයත් සමග සිංහලයන් බහුතරය බැවින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිංහල මන්ත්‍රී සංඛ්‍යාව වැඩිවේවිය යන බිය හේතුවෙනි. ඩොනමෝර් කොමිසම විසින් ඒ විරුද්ධතා මැද සර්වජන ඡන්දය ලබාදුන්නේ ඔවුන් විසින් එවකට බිහි කරනු ලැබ සිටි සිංහල හා දෙමළ නායකයන් ගැන ඔවුන්ට විශ්වාසයක් තිබූ බැවිනි. එහෙත් දෙමළ නායකයෝ තම සටන අත්නොහළහ. ජී ජී පොන්නම්බලම් මහතා තම කුප්‍රකට පනහට පනහ ඉල්ලීම ඉදිරිපත් කෙළේ කෙසේ හෝ රාජ්‍ය මන්ත්‍රණ සභාවෙහි දෙමළ මන්ත්‍රීවරුන් බහුතරය බවට පත්කර ගැනීමට ය. එහෙත් රවැනි සටකපට මාර්ගයෙන් නායකත්වයට පත්වීමට නොහැකි බව තේරුම් ගැනීමට ඔහුට කල්ගත විය.

සෝල්බරි කොමිසම පැමිණි අවස්ථාවෙහි ද දෙමළ නායකයෝ තම ව්‍යායාමය අත් නො හළහ. ඡන්ද කොට්ඨාශ බෙදීම ඒවාහි ඡන්දදායකයන් ප්‍රමාණය නිර්ණය කිරීම ආදී ක්‍රියා ඔස්සේ සිංහල මන්ත්‍රීන් බහුතරය බවට පත්වීම වැළැක්වීම දෙමළ නායකයන්ගේ අපේක්ෂාව විය. එහෙත් මේ අපේක්ෂාව ඉටුකර දීමට සෝල්බරි සාම්වරයා පවා අපොහොසත් වී ඇත. අවසානයේ දී ඊනියා බහු මන්ත්‍රී ආසන ලබාදීමෙන් දෙමළ අපේක්ෂා යම් ප්‍රමාණයකට හෝ ඉටුකිරීමට සෝල්බරි සාම්වරයා උත්සාහ ගත්තේ ය.

© Prof. Nalin De Silva

මේ පළමු යුගයේ දෙමළ නායකයන්ගේ අපේක්ෂාව වූයේ මුළු රටේ ම නායකත්වයට පත්වීමට ය. ඒ පිටුපස වූයේ සිංහලයනට මේ රටේ තමන්ට හිමිතැන ලබා නො දීම ය. මෙරට අනන්‍ය සංස්කෘතියක් ගොඩ නැගුවා වූ ද අවුරුදු දෙදහසකට වැඩි ඉතිහාසයකට හිමිකම් කීවා වූ ද, රටේ ජනගහනයෙන් සියයට හැත්තෑපහකට වැඩි වූ ද සිංහලයන්ට හා ඔවුන්ගේ සංස්කෘතියට හිමිතැන ලබා නො දීමේ වුවමනාවක් ඉංගිරිසින්ට ද ඔවුන්ගේ සහාය, ආශිර්වාදය හා අනුග්‍රහය ලැබූ දෙමළ නායකයන්ට ද විය. විශේෂයෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතිය යටපත්කිරීමේ හැකිනම් ඒ විනාශකිරීමේ අවශ්‍යතාව ඉංගිරිසින්ට ද කතෝලික හා ක්‍රිස්තියානි නායක පූජකවරුන්ට ද විය.

නායක පූජකවරුන් කෙසේ කටයුතු කළ ද, සාමාන්‍ය සිංහල කතෝලික හා ක්‍රිස්තියානි ජනයාට සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීමේ අවශ්‍යතාවක් නො වී ය. ඔවුන්ගෙන් බහුතරය, විශේෂයෙන් ම සිංහල කතෝලික ජනයා සංස්කෘතියෙන් සිංහල බෞද්ධ වූහ. ඇතැම් උගත් බෞද්ධයන්, එනම් කාලාම සූත්‍රය ඊනියා විද්‍යාත්මක විධික්‍රමයක් සමග ගැටගසන, ජ්‍යොතිෂය හෙළාදකින, විෂ්ණු ආදී දෙවිවරුන් දේවාලවලින් ඇද දැමීමට තැත්කරන, ඇතැම්විට පුනරුත්පත්තියක් ද නැතැයි කියන ඕල්කට් බෞද්ධයන් ආදීන්ට වඩා කතෝලික ජනතාවගෙන් විශාල පිරිසක් සංස්කෘතියෙන් සිංහල බෞද්ධයෝ වූහ. දැනුදු ඔවුහු එලෙස සංස්කෘතියෙන් සිංහල බෞද්ධයෝ වෙති.

සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල කිරීමට, හැකිනම් විනාශකිරීමට අවශ්‍ය වුවන් අතර සාමාන්‍ය දෙමළ ජනතාව ද නො වූහ. දෙමළ හින්දු සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතියෙන් වෙනස් නමුත් ඒ කිසිසේත් ම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ ප්‍රමාණයට නො වී ය. එහෙත් දෙමළ ජනයා අතර සිංහල බෞද්ධ සංස්කෘතියට විරුද්ධ වූ පිරිසක් ද වෙති. ඒ දෙමළ ක්‍රිස්තියානි හා කතෝලික පූජකවරුන්ගේ අතිමහත් බහුතරය හා ඇතැම් දෙමළ ක්‍රිස්තියානි හා කතෝලික ප්‍රභූවරු වෙති. කතෝලික චින්තනය ලෝ පුරා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පැර දී ඇති නමුත් අද කතෝලික නායක ප්‍රජකවරු හා ඇතැම් ප්‍රභූවරු තම තැන රැකගැනීම සඳහා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පසුපස යති. මෙය පාප් වහන්සේට වුව ද වලංගු වෙයි.

සිංහල කතෝලික හා ක්‍රිස්තියානි ජනතාව තමන්ට සිංහල බෞද්ධ සංස්කෘතියෙන් තර්ජනයක් නොමැති බව තේරුම්ගෙන බොහෝ කල් ය. සිංහල සංස්කෘතියෙහි ඇති විශේෂත්වයක් නම් සිංහල ජාතිකත්වය දේශපාලන නායකයන් විසින් මෙහෙයවනු නො ලැබීම ය. සිංහල ජාතික ව්‍යාපාරයට නායකත්වය දෙන්නෝ දේශපාලකයෝ නො වෙති. ඒ බව අප කිහිප වතාවක් ම සඳහන් කර ඇත. අනුරාධපුර යුගයේ සිට ම සංස්කෘතික ආධිපත්‍යය (එයට ආධිපත්‍යය යැයි කීම නුසුදුසු යැයි දැන් වැටහෙයි. වඩා සුදුසු පදය වනුයේ සංස්කෘතික අනුශාසකත්වය යන්න ය) මහාවිහාරික භික්ෂූන් වහන්සේ සතු වූහ. (වැඩි විස්තර සඳහා විදුසර ලිපි බලන්න) රජුගෙන් ලැබුනේ දේශපාලන නායකත්වය ය. අදත් සිංහල සංස්කෘතියෙහි මේ විශේෂත්වය වෙයි. බණ්ඩාරනායක මහතා ජාතික ව්‍යාපාරයට අවනත වූවා මිස එතුමා ජාතික ව්‍යාපාරයට නායකත්වය නුදුන්නේ ය.

එහෙත් ඉංගිරිසි හා දෙමළ සංස්කෘතිවල ඒ එසේ නො වෙයි. එහි ජාතික ව්‍යාපාර දේශපාලන නායකයන් විසින් මෙහෙයවනු ලැබෙයි. අවුරුදු සියයකට වැඩි කලක් තිස්සේ ඉංගිරිසින්ගේ ආශිර්වාදය හා අනුග්‍රහය මැද රටේ ම නායකත්වය තමන් අතට ගැනීමට බලා සිටි දෙමළ හින්දු නායකයෝ හතළිස් හයෙන් පමණ පසු සිංහල නායකයන්ගේ නායකත්වය පිළිගැනීමට සූදානමින් සිටිය හ. එක්සත් ජාතික පක්ෂය නමින් ඩී එස් සේනානායක මහතාගේ නායකත්වයෙන් පිහිටුවනු ලැබූ පක්ෂය සමග එක් වී ඇමතිකම් ලබාගැනීමට දෙමළ හින්දු නායකයන්ට හැකිවිය.

එසේ වුවත් එයට අකමැතිවූ පිරිසක් විය. ඔවුන්ට නායකත්වය දුන්නේ දෙමළ ක්‍රිස්තියානි නායකයකු වූ එස් ජේ වී චෙල්වනායගම් මහතා ය. ඔහු දෙමළ ජනතාවට දෙවැනි අපේක්ෂාවක් ලබා දුන්නේ ය. මධ්‍යයෙහි නායකත්වයට පත්වීමට නොහැකි බව දුටු ඒ මහතා අඩුම තරමින් උතුරු හා නැගෙනහිර නමින් කෘත්‍රිම ව පළාත් දෙකක් වෙන්කර ගෙන එහි දෙමළ රාජ්‍යයක් පිහිටුවීමට කටයුතු කෙළේ ය. මුළු රටේ ම බැරි නම් රටෙන් කොටසක් කඩාගෙන හෝ එහි නායකයා වීම ඔහුගේ අරමුණ විය. ඒ සඳහා ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය හෙවත් ෆෙඩරල් පක්ෂය පිහිටුවනු ලැබී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva